සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

62 | S | I

Grade 10 - Third Term Evaluation - 2024 (2025 January)

තුන්වන වාර ඇගයීම - 2024 (2025 ජනවාරි) - 10 ශ්‍රේණිය

බුද්ධ ධර්මය - I

Buddhism - I

කාලය : පැය 01
Time : 01 hour

ROYAL COLLEGE
25 FEB 2025
COLOMBO - 07

Name : ..... Class : ..... Index No : .....

උපදෙස්

* **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. සිදුහත් කුමරු ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගත්තේ
(1) අසිත තවුසාගෙන් (2) ආලාරකාලාම තවුසාගෙන්
(3) සර්වමිත්‍ර පඬිවරයාගෙන් (4) ඉහත සියලු දෙනාගෙන්

02. සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියේ,
(1) ඇසළ පුන්පෝද (2) වෙසක් පුන්පෝද
(3) උඳුවප් පුන්පෝද (4) බිනර පුන්පෝද

03. භද්දකච්චානා හෙවත් යශෝදරාවන්ගේ පියා වූයේ
(1) බිම්බිසාර රජතුමා (2) කොසොල් රජතුමා
(3) උදේනි රජතුමා (4) සුප්‍රබුද්ධ රජතුමා

04. ගැබිනි මාතාවන්ට ආශීර්වාද පතා දේශනා කරනුයේ,
(1) රතන සූත්‍රය (2) අංගුලිමාල සූත්‍රය (3) ගිරිමානන්ද සූත්‍රය (4) පරාභව සූත්‍රය

05. තමා විසින් ම පිළිපැද ඇස් පනාපිට මෙලොව දීම ප්‍රතිඵල දැක ගත හැකි බැවින් ධර්මය
(1) සන්දිට්ඨික වේ. (2) අකාලික වේ. (3) ඕපනයික වේ. (4) ස්වාක්ඛාත වේ.

06. බොර ජලයට සමාන කොට දක්වා ඇත්තේ
(1) කාමච්ඡන්ද (2) ථීනමිද්ධ
(3) විචිකිච්ඡා (4) උද්ධච්ච කුක්කුච්ච

07. පුද්ගල චරිත හයකි. ඊට අයත් නොවන්නේ
(1) දෝස චරිත (2) සද්ධා චරිත (3) විතක්ක චරිත (4) විරිය චරිත

08. තම අභිමතය පරිදි සාර මසක් මුළුල්ලේ භාවනා කොට ප්‍රතිඵල නොලැබූ ස්වර්ණකාර හිමියන්ගේ ගුරුවරයා වූයේ
(1) සැරියුත් හිමි (2) මුගලන් හිමි (3) මහා කාශ්‍යප හිමි (4) ආනන්ද හිමි

09. සමථ භාවනාව හඳුන්වන තවත් නමක් වන්නේ
(1) ප්‍රඥා භාවනා (2) චිත්ත භාවනා (3) පිළිකුල් භාවනා (4) අනිත්‍ය භාවනා

CamScanner

10. වැලිවිට ශ්‍රී සරණංකර නාහිමියන්ට සංඝරාජ පදවිය පිරිනමන ලද්දේ
(1) භයවන පරාක්‍රමබාහු රජු (2) හතරවන පරාක්‍රමබාහු රජු
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (4) පස්වන බුවනෙකබාහු රජු

11. සරණංකර සංඝරාජයාණන් වහන්සේ රචිත ග්‍රන්ථයක් නොවන්නේ
(1) බුදුගුණ අලංකාරය (2) මුණිගුණ අලංකාරය
(3) සාරාර්ථ සංග්‍රහය (4) රතනත්‍ර ප්‍රණාම ගාථා සත්තය

12. දුටුගැමුණු රජතුමා සිදු කළ වෙසක් උත්සව ගණන
(1) 14 කි. (2) 34 කි. (3) 28 කි. (4) 24 කි.

13. පිරිසිදුව කටයුතු කිරීම කයින් වචනයෙන් හා සිතින් නිදෙස් දේ කිරීම ..... හඳුන්වන්නේ,
(1) සුචිකම්ම (2) නිසම්මකාරී (3) ධම්මජීවි (4) සඤ්ඤත ලෙසිති

14. ගිහි විනය පැහැදිලි කෙරෙන සූත්‍රය වන්නේ,
(1) මංගල සූත්‍රය (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
(3) සිගාලෝවාද සූත්‍රය (4) අග්ගඤ්ඤ සූත්‍රය

15. යුතුකම් ඉටුකිරීම් අතර "සමානාත්මතාව දැක්වීම" අයත්වන්නේ
(1) සේව්‍ය - සේවක අතර (2) යහළු - මිත්‍ර අතර
(3) ගුරු සිසු අතර (4) අඹු - සැමි අතර

16. මිනිසුන් රාගයෙන් රාගයට ම යති. ද්වේශයෙන් ද්වේශයට ම යති. මෝහයෙන් මෝහයටම යති. මේය හඳුන්වන්නේ
(1) අනුසෝතගාමිය (2) පටිසෝතගාමිය (3) නිර්වාණගාමිය (4) පද්මාකාරගාමිය

17. දෙවන ආත්මභාවයෙන් පසු කවර හෝ ආත්මභාවයක විපාක දෙන කර්මය වන්නේ,
(1) උපපජ්ජවේදනීය කර්ම (2) අහෝසි කර්ම
(3) අපරාපරියවේදනීය කර්ම (4) ගරුක කර්ම

18. කෘත්‍ය හෙවත් කාර්යයන් අනුව කර්මය සතරාකාරය, ඊට අයත් නොවන්නේ
(1) ජනක කර්ම (2) උපත්ථම්භක කර්ම
(3) උපපීඩක කර්ම (4) කටත්තා කර්ම

19. "අපි වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාසය කරමු" යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් පද පේළිය වන්නේ,
(1) සුසුඛංවත ජීවාම ..... වේ (2) අක්කොච්ඡි මං අවධි මං ..... වේ.
(3) ධම්මෝ හවේ රක්ඛති ..... වේ. (4) දූරංගමං ඒක චරං ..... වේ.

20. පංචස්කන්ධය උපමා වශයෙන් දක්වන තැන දී වේදනාව
(1) දිය බුබුලකට (2) පෙණ පිඬකට (3) මායාවකට ය. (4) පියුමකට ය.

21. "හේතුවෙන් උපදින යම් ධර්ම කෙනෙක් වෙත් ද ඒ ධර්මයන්ගේ හේතුව තථාගතයන් වහන්සේ වදළ සේක" අස්සජි හිමියන් මෙසේ දේශනා කළේ
(1) කෝලිත පිරිවැජියන්ට (2) උපක ආජීවකයන්ට
(3) උපතිස්ස පිරිවැජියන්ට (4) පස්වග තාපසවරුන්ට

22. "ඉමස්මිං සති ඉදං හෝති" මෙහි තේරුම
(1) මෙය නැති කල්හි මෙය නොවේ (2) මෙය නැති වී යාමෙන් මෙය නැතිවේ
(3) මෙය ඉපදීමෙන් මෙය උපදී (4) මෙය ඇති කල්හි මෙය වෙයි

23. ජාති, ජරා, ව්‍යාධි, මරණාදී දුක් හටගන්නා ආකාරය පැහැදිලි කෙරෙන්නේ
(1) දුක්ඛාර්ය සත්‍යයෙනි (2) අනුලෝම පටිච්චසමුප්පාදයෙනි
(3) ත්‍රි ශික්ෂාවෙනි (4) පටිලෝම සමුප්පාදයෙනි

CamScanner

24. බුදුන්වහන්සේ දහවන වස් කාලය ගත කළේ
(1) පාරිලෙය්‍ය වනයෙහි (2) වේළුවනයෙහි
(3) මකුල පර්වතයෙහි (4) වාලිය පර්වතයෙහි

25. බුද්ධ දින චර්යාවෙහිදී දෙවියන් සඳහා වෙන් කර තිබුණේ
(1) පෙර බත් කිස (2) පසු බත් කිස
(3) මැදි යම් කිස (4) පෙර යම් කිස වේලාවය

26. අනුන්ගේ අත් උදව් නැතිව නැගිටින්නට බැරි තරමට ආහාර ගන්නා හඳුන්වන්නේ
(1) කාකමාසක ලෙස (2) අලංසාටක ලෙස
(3) භුත්තවම්මික ලෙස (4) ආහාර හත්ථක ලෙස

27. බෞද්ධයාගේ අත්පොත, නම් වූ ධම්මපදයේ
(1) ගාථා 448 කි වග්ග 32 කි (2) ගාථා 423 කි වග්ග 26 කි
(3) ගාථා 547 කි වග්ග 18 කි (4) ගාථා 523 කි වග්ග 26 කි

28. දෙවන ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළේ
(1) සබ්බකාමී මහරහතන් වහන්සේ (2) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ
(3) උපාලි මහරහතන් වහන්සේ (4) මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ

29. සර්වාස්ථිවාදි සංගායනාව ලෙස හැඳින්වෙන්නේ
(1) තෙවන සංගායනාව (2) පළමු සංගායනාව
(3) කණිෂ්ක ධර්ම සංගායනාව (4) අලුවිහාර සංගායනාව

30. ගර්භයේ හැඩය අනුව "ඝටාකාර" යනු
(1) ඝණ්ටාරයක හැඩය (2) දියබුබුලක හැඩය
(3) පියුමක හැඩය (4) කළයක හැඩය

31. "අඩ්ඪචන්දපාසාණ" යනුවෙන් හැඳින්වෙන්නේ
(1) පියගැටපෙළ (2) සඳකඩපහණ (3) වාහල්කඩ (4) මුරගල

32. පොළොන්නරු යුගයේ පැරණි සිතුවම් පැවති ස්ථානයක් නොවන්නේ
(1) සීගිරිය (2) දිඹුලාගල ලෙන්
(3) මහියංගණ ස්තූප ධාතු ගර්භය (4) තිවංක පිළිම ගෙය

33. අමාවතුර ග්‍රන්ථයේ කතුවරයා වන්නේ
(1) ධර්මසේන හිමි (2) විද්‍යාචක්‍රවර්ති
(3) ගුරුළුගෝමී පඬිවරයා (4) එස්. මහින්ද හිමි

34. සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍යය වන්නේ
(1) බුත්සරණ (2) පන්සිය පනස් ජාතක පොත
(3) පූජාවලිය (4) කව්සිළුමිණ

35. සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කළේ
(1) වජ්ජී රජදරුවන් (2) කොසොල් රට වැසියන්
(3) ශාක්‍ය රජදරුවන් (4) විශාලා මහනුවර රජදරුවන්

36. සතර අගතිවලට අයත් වන්නේ
(1) මෙත්තා (2) මෝහය (3) මුදිතා (4) දානය

37. අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම සතර සංග්‍රහ වස්තු වලින් එකකි එනම්,
(1) ප්‍රිය වචන (2) දානය (3) අර්ථචර්යාව (4) සමානාත්මතාවයයි

CamScanner

38. ත්‍රිවිධ රත්නය පිළිබඳ ඇතිකරගත් නිසැක බව වනුයේ,
(1) ශ්‍රද්ධාව නම් වේ
(2) කරුණාව නම් වේ
(3) මුදිතාව නම් වේ
(4) උපේක්ඛා නම් වේ

39. බෞද්ධයාගේ නිත්‍ය සීලය වන්නේ,
(1) අටසිල්
(2) දසසිල්
(3) උපෝසථ සිල්
(4) පන්සිල්

40. ලක්දිව ඉදිවූ මුල් ම දගැබ වන්නේ
(1) මහියංගණ චෛත්‍ය
(2) ථූපාරාම චෛත්‍ය
(3) මිරිසවැටි චෛත්‍ය
(4) කැලණි විහාර චෛත්‍ය

❋ ❋ ❋

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

CamScanner

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 10 – Third Term Test – 2024 (January 2025)
10 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2024 (2025 ජනවාරි)

කාලය : පැය 2
Time: 2 hours

බුද්ධ ධර්මය -11

3	S	II

Name: - ..... class: -..... Index no: - .....

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිලිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් සෑම ප්‍රශ්නයකටම 10 බැගින් හිමිවේ.

01.

I සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඩිවරයාගේ නම කුමක්ද?
II "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති" ආදී වශයෙන් නිබඳුන පද පවසනු ලැබුවේ කවුරුන් විසින්ද?
III පඤ්ච නීවරණ ධර්මවලින් දෙකක් නම් කරන්න.
IV බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා දෙක මොනවාද?
V "සති සම්පජඤ්ඤ" "සන්තුට්ඨිතා" මෙහි අර්ථ දෙක ලියන්න.
VI ත්‍රිපිටකයෙන් දෙකක් නම් කරන්න.
VII බුදු දහමෙහි දැක්වෙන සිරින් හා විරින් යන්නෙහි අදහස පැහැදිලි කරන්න.
VIII සිව් බඹ විහරණ වලින් දෙකක් ලියන්න.
IX ඉපදීම නිසා සත්වයාට පිදීමට සිදුවන දුක්ඛයන් දෙකක් නම් කරන්න
X වෛද්‍ය වර්ග භයක් වේ. ඉන් දෙකක් නම් කරන්න.

02.

I සිගාලෝවාද සූත්‍රයේදී නැගෙනහිර දිශාව හා දකුණු දිශාවන්ට උපමා කරනු ලැබුවේ කවරහුද?
II ගුරුවරයාගෙන් ශිෂ්‍යයන්ට ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න.
III "අන්‍යොන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීමෙන් සමස්ත සමාජයේම දියුණුව සිදුවේ" පැහැදිලි කරන්න.

03.

I පුද්ගලයාගේ කීර්තිය (යසස) වැඩිවීමට ඉවහල් වන කරුණු අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න.
II ඉහත ගාථාවේ අදහස ලියන්න.
III ධම්මපදය පුද්ගල ජීවිතයේ සංවර්ධනය වටිනා උපදෙස් ලබාදෙයි. උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

04.

I විපාක දෙන කාලය අනුව කර්මය ප්‍රභේද හතරක් වේ. ඉන් දෙකක් දක්වන්න.
II "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" මේ පාඨය ඇසුරින් කර්මය කෙටියෙන් ලියන්න.
III කුසලාකුසල කර්මය පිළිබඳ අවබෝධය මෙලොව පරලොව ජීවිත සාර්ථක කර ගැනීමට ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

05.

I අවිඩිමත් මෙන්ම ගිජුලෙස ආහාර අනුභව කරන්නන් පස්දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. ඉන් දෙදෙනෙකු නම් කරන්න.
II ආහාර අනුභවයේදී නොකළයුතු දේ සේඛියා ලෙස හැඳින්වේ. ඉන් තුනක් ලියන්න.
III නිවැරදි ආහාර අනුභවය නිසා නිරෝගිකම රැකේ. සේඛියා ඇසුරෙන් පැහැදිලි කරන්න.

CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

06.
I ස්ථූපය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
II ස්ථූපයක රූප සටහනක් ඇද එහි කොටස් නම් කරන්න.
III ශ්‍රී ලාංකික කලා ශිල්පීකන්ගේ කලා කුසලතාව ඇගයීමට ලක් කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් 2 කට පමණක් කෙටි සටහන් ලියන්න.
I වැලිවිට සරණංකර මාහිමි
II මානලේ අලුවිහාර සංගායනාව
III අපි පරිසර හිතකාමී වෙමු
IV සමථ භාවනාව

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner